කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 18 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 04 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ටැෆේ ට්‍රැක්ටරයේ රු.1,625,000 ක් වූ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) 2013 පෙබරවාරි 08 දින ලැබී තිබුණු ට්‍රැක්ටරයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු.3,232,282 ක් වූ ෆෝටන් ක්‍යෑ කැබ් රථය රු.3,200,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) රු.50,662 ක් වූ හිඟ ටෙන්ඩර් මුදලක් ලැබිය යුතු ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 කට අදාළ ගිණුම් අනුව ශේෂයන් හා ඊට අදාළ අනුරූපී උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු. 1,528,276 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) <u>ලැබියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.185,516,718 ක් වූ අතර, එම මුදලින් රු.51,472,761 ක් වසර එකකට වැඩි කාලයක සිට අයවීමකින් තොරව පැවතුණි.

(ආ) <u>ගෙවියයුතු ගිණුම්</u>

2016 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 39,260,810 ක් වූ අතර, එම මුදලින් රු.2,859,330 ක් වසර එකකට වැඩි කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් හා ගොඩනැගිලි උපලේඛනයේ ඉඩම් හා ගොඩනැගිලි 299 ක වටිනාකම් සඳහන් වූවත්, ස්ථාවර වත්කම් ලේඛනයේ ඔප්පු සහිත ඉඩම් 174 ක් පමණක් සඳහන් කර තිබූ බැවින් ඉඩම් 125 ක් සඳහා ඔප්පු ලබාගෙන නොතිබුණි.

(ආ) රු.7,246,880 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් වූ ශේෂ සනාථ කිරීම් සහ උප ලේඛණ විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

**02 මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.63,234,039 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.73,942,450 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,708,411 ක පහත වැටීමක් සිදුවී තිබුණි.

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

පුනරාවර්තන ආදායම් රු.4,775,731 කින් අඩුවීම සහ පුනරාවර්තන වියදම් රු.708,332 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පහත වැටීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

**2.3 ආදායම් පරිපාලනය**

---------------------

**2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රුපියල් මිලියන 89 ක් වූ අතර තත්‍ය ආදායම රුපියල් මිලියන 158 ක් විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ආදායම් රුපියල් මිලියන 51 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ආදායම් රුපියල් මිලියන 185 ක් විය.

**2.3.2 වරිපනම් හා බදු**

----------------

සමාලෝචිත වර්ෂයට අදාළ බිල් කිරීම් රු.1,882,263 ක් වූ අතර, එම මුදලින් රු.1,722,000 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණි. 2016 ජනවාරි 01 දිනට පැවති රු.581,000 ක වරිපනම් හා බදු හිඟයෙන් වර්ෂය තුළදී රු.227,000 ක් පමණක් අයකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් හා බදු ශේෂය රු.476,361 ක් විය.

**2.3.3 වෙනත් ආදායම්**

------------------

හිඟහිටි වෙනත් ආදායම් තුළ ඇති රු.172,135 ක ශේෂ 03 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙනවිත් තිබූ අතර එම මුදල අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම සහ මුද්දර ගාස්තු ආදායම පිළිවෙලින් රු.23,769,359 ක් සහ රු.103,303,026 ක් විය.

**03 මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යය සාධනය**

-------------------

රු.1,150,000 ක් වූ ප්‍රාග්ධන වැය විෂයයන් 04 කට අදාළ ප්‍රතිපාදනයන් උපයෝජනය කර නොතිබුණු අතර, වැය විෂයයන් 06 ක් වෙනුවෙන් සැලසු රු.6,750,000 ක් වූ ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු 3,174,019 ක් පමණක් වැය කර තිබු අතර ප්‍රගතිය සියයට 1 සිට සියයට 63 දක්වා පරාසයක පැවතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අංක ඕඩී 80 දරන මාර්ග තලන යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා රු.1,278,299 ක ඇස්තමේන්තුවක් මත 2016 මැයි 31 දින නියෝජිත ආයතනය වෙත භාර දී තිබූ නමුත් යන්ත්‍රය අළුත්වැඩියා කර ආපසු භාරදිය යුතු දිනයන් පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවයකට පැමිණ නොතිබුණි. අළුත්වැඩියාවෙන් පසු 2017 ජනවාරි 17 දින සභාවට ලැබී තිබුණු යන්ත්‍රය කාර්මික දෝෂයක් හේතුවෙන් 2017 පෙබරවාරි මාසයේදී නැවත අළුත්වැඩියාව සඳහා පෙර කී ආයතනයට යොමුකර තිබුණි.

(ආ) ගොඩගම ප්‍රජාමූල සංවිධානය යටතේ වූ ජල ව්‍යාපෘතියේ ජල ටැංකි ඉදිකර ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සභාව විසින් අධීක්ෂණයක් සිදුකර අදාළ ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට පියවර ගෙන නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාර්ග නඩත්තු කටයුතු වෙනුවෙන් අවශ්‍යවන කාණුකැට මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේ සභාව විසින් ලබාගෙන තිබූ මිල ගණන්වලින් සැපයුම්කරු තෝරා ගැනීම ප්‍රසම්පාදන කමිටුවක් මගින් කරනවා වෙනුවට කළමනාකරණ කමිටුවක අනුමැතිය මත සිදුකර තිබුණු අතර, 2016 වර්ෂය සඳහා රු.626,930 ක් වැයකර සිදුකර තිබුණු කාණුකැට මිලදී ගැනීමද 2015 මිල ගණන් පදනම්ව ප්‍රසම්පාදන මග පෙන්වීම්වලට පටහැනිව සිදුකර තිබුණි.

(ආ) එකතුව රු.5,870,539 ක් වූ කළුගල් නිෂ්පාදන තොගයක් සභාව විසින් වර්ෂය තුළදී සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් මිලදීගෙන තිබුණු අතර මෙහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව 2013 මිල ගණන් කැඳවීමක් මත අදාළ මිලදී ගැනීම සිදුකර තිබුණි.

**3.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජල ව්‍යාපෘතියක් සඳහා 2010 වර්ෂයේදී මිලදීගෙන තිබුණු රු.76,212 ක් වූ ජල උපකරණ තොගයක් වර්ෂ 6 ක පමණ කාලයක් සභාවේ ගබඩාව තුළ නිෂ්කාර්යව තිබෙන අතර, අදාළ ජල ව්‍යාපෘතියේ ඉදි කිරීම්ද අතහැර දමා තිබුණි.

(ආ) 2013 ජුලි 26 දින පරිත්‍යාග ලෙස ලැබී තිබුණු 10'x10' අඟල් 1.5 GI බට සහිත රෙස්ලින් රෙදි යොදා සකස් කළ ජංගම බහු කාර්යය හට් 11 ක රෙස්ලින් රෙදි ඉරී යාම හේතුවෙන් එම කුටි භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.

(ඇ) චෝක් කොයිල් 216 ක් හා ජල බවුසරය සඳහා භාවිතා කරන ලද වතුර මෝටර් 2 ක් ගබඩාවේ නිශ්කාර්යව තබා තිබුණි.

**3.5 හඳුනාගත් අලාභ**

------------------

මෝටර් රථ හා කරත්ත ලේඛනයෙහි සඳහන්ව ඇති රු.224,974 ක් වටිනා කසල කරත්ත 08 න් 06 ක් භෞතිකව නොතිබුණි.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.1,000,000 ක් වූ ඇස්තමේන්තු අගයක් මත අළුත්වැඩියා කටයුතු සිදුකර තිබුණු කිතලව පුස්තකාල ගොඩනැගිල්ලේ සිමෙන්ති ගෙබිම අඩි 8 ක දිග ප්‍රමාණයක් පුපුරා තිබීම සහ ගොඩනැගිල්ල වටා වූ පඩිය ස්ථාන 3 කින් පුපුරා තිබීම මත අදාළ කර්මාන්තය නියමිත ප්‍රමිතියෙන් සිදුකර නොතිබෙන තත්ත්වයක් අනාවරණය විය.

(ආ) ගෙබිම දෙවරක් පොලිෂ් අලේප කිරීම සඳහා රු.37,657 ක් ගෙවීම් කර තිබුණද, භෞතික පරීක්ෂාවට අනුව නිමාව සුදුසු පරිදි නොතිබුණි.

## 3.7 ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය

--------------------------------

කසළ විධිමත්ව බැහැර කිරීම සඳහා නිසි ක්‍රම වේදයක් නොතිබුණ බැවින් අලහිටියාවත්ත නැමති ඉඩමට කසල බැහැර කර තිබුණි. නමුත් 2016 දෙසැම්බර් මස වන විට ජීව වායු ඒකකයක් ඉදිකර සභාව දෛනිකව රැස්කරන දිරන කසළ ජිව වායු ඒකකයට දැමීම තුලින් ජනනය වන මීතෙන් වායුව ඉදිරියේදී ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කරමින් පැවතුණි.

## 04. පද්ධති හා පාලනය

--------------------

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දුර්වලතාවයන් වරින් වර ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ස්ථාවර වත්කම් වටිනාකම් වැරදි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හා හිඟ ආදායම් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් | ඉඩම් සඳහා ඔප්පු ලබා ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ඇ) ජංගම වත්කම් | නිෂ්කාර්යය හා ඌණ උපයෝජිත තොග පැවතීම. |
| (ඈ) ලැබිය යුතු ගිණුම් | හිඟහිටි වෙනත් ආදායම් සඳහා සාක්ෂි නොමැති වීම. |
| (ඉ) මිලදී ගැනීම් | ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීම. |
| (ඊ) කොන්ත්‍රාත් පරිපාලනය | ජල ව්‍යාපෘති සඳහා නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම.<br>ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමේදී අඩුපාඩු පැවතීම. |